**ශීර්ෂය - 025 සීමා නීර්ණය කොමිෂන් සභාව - 2025**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය **- 025** - සීමා නීර්ණය කොමිෂන් සභාවේ .2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සීමා නීර්ණය කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2026 මැයි **20** දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව සීමා නීර්ණය කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 ජුනි 30 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

සීමා නීර්ණය කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව සීමා නීර්ණය කොමිෂන් සභාවේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සීමා නීර්ණය කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය **කරනු නොලැබේ.**

## 1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සීමා නීර්ණය කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සීමා නීර්ණය කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 වියදම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු අදාල රෙගුලාසි අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙළ කළ යුතු වුවත්, පුනරාවර්තන වැය විෂයයන් 04 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වලින් සියයට 20 සිට සියයට 100 දක්වා වූ රු.531,170 ක ප්‍රතිපාදන ද, ප්‍රාග්ධන වැය විෂයක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වලින් සියයට 100 ක් වූ රු.40,000 ක ප්‍රතිපාදන ද උපයෝජනය කර නොතිබීමෙන් ඇස්තමේන්තු එකී රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. | අවශ්‍යතාවය අනුව වියදම් දරන ලද බව. | ඇස්තමේන්තු සකස් කිරීමේදී නිවැරදි පුරෝකථනයන් සහිතව හැකිතාක් තාත්ත්විකව සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | **නිරීක්ෂණය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 10 වගන්තිය | කොමිෂන් සභාව විසින් 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව තොරතුරු දැන ගැනීමේ | අදාල වාර්ෂික වාර්තාව මෙම වර්ෂයේ සිට තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ | වාර්ෂික වාර්තාව නියමිත දිනට පෙර යැවීමට |

| | | | | |
|---|---|---|---|---|
| | | අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත 2025 දෙසැම්බර් 31 දින වන විටත් යවා නොතිබුණි. | කොමිෂන් සභාව වෙත යැවීමට කටයුතු කරන බව. | කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | කොමිෂන් සභාව සතුව පවතින වාහන දෙකක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | වහාම ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛයේ සඳහන් උපදෙස් ප්‍රකාරව වාහන වල ඉන්ධන දහන පරීක්ෂාව කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. | නිරීක්ෂණය පිළිගෙන ඇති බව. | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 261 (2) රෙගුලාසිය | චෙක්පතක් මඟින් ගෙවීම් කෙරෙන කල චෙක්පතේ අංකය වවුචරයේ මෙන්ම මුදල් පොතේ නියමිත සටහන ඉදිරියෙන් සටහන් කල යුතු බව දක්වා තිබුණද කරන ලද නියදි විගණන පරීක්‍ෂාව අනුව එසේ සඳහන් නොකළ අවස්ථා 80 ක් නිරීක්ෂණය විය. | මෙවැනි අඩුපාඩු ඉදිරියේදී ඇති නොවන ලෙස කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දුන් බව. | වවුචර් සහ මුදල් පොතේ අදාල සටහන් පවත්වා ගත යුතුය. . |

## 4. යහපාලනය

### 4.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුතු කොමිෂන් සභා රැස්වීම් 12 ක් 2025 වර්ෂය තුලදී පවත්වා තිබුණද සීමා නිර්ණය සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකය විසින් දන්වා නොතිබීම හේතුවෙන් කොමිෂන් සභාවේ අරමුණු ඉටු කිරීමට අදාල ක්‍රියාමාර්ග | කොමිෂන් සභාව ස්ථාපිත කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එහි 95 ව්‍යවස්ථාව අනුව ඇති කාර්යයන් නිරන්තරයෙන් ඉටුකිරීමේ අවස්ථාව නොයෙදේ. ඒ අනුව 2025 වර්ෂයේදීද පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස සීමානිර්ණය කිරීමක අවශ්‍යතාවක් ගරු ව්‍යවස්ථාදායකය විසින් දන්වා නොතිබුණි. කොමිෂන් සභාවේ බලතල හා කාර්යභාරය පුළුල්කිරීම සඳහා පනත් කෙටුම්පත් | සභාවේ අරමුණු ඉටු කර ගැනීමට අදාලව අවශ්‍ය සැලසුම් සකස් කල යුතු අතර සභාවේ කාර්යයභාරය පවත්වා ගැනීම සම්බන්ධ වගකිව යුතු පාර්ශවයන් සමඟ සාකච්ඡා වලට එළඹිය යුතුය. |

| | |
|---|---|
| එම රැස්වීම් තුලදී සාකච්ඡා වී නොතිබුණි. | සකස්කර අදාළ අංශ හා බලධාරීන් වෙත යොමුකර තිබේ.<br>මේ සම්බන්ධයෙන් කොමිෂන් සභා රැස්වීම්වලදී සාකච්ඡා වුවද විශේෂයෙන් ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳව සඳහන් කිරීමට විශේෂිත කරුණු නොමැතිවූ හෙයින් සටහන් නොකරන ලදී. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව සෑම අස්ථිත්වයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටු පවත්වා ගතයුතු වුවද 2015 වර්ෂයේ සිට විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | නිරීක්ෂණය පිළිගෙන ඇති බව. | කඩිනමින් විගණන හා කළමනාකරණ කමිටු පත්කිරීමට හා පැවැත්වීමට කටයුතු කළ යුතුය. |